# Proceedings

# ULA Academic Sessions- 2014

(ULA AS-2014)

## "Information Literacy for Moving to Mastery"

University Librarians Association

ULA

Sri Lanka

6th February 2015

**University Librarians Association of Sri Lanka**

**University of Ruhuna**

**Matara**

**Sri Lanka**

## ULA AS 2014 - 08

# ශ්‍රී ලංකාවෙහි විශේෂ පුස්තකාල තුළ තොරතුරු අලෙවිකරණය ආශ්‍රිත ගැටලු

ජී. එම්. එස්. කේ. ගිරාකඩුව
සහකාර පුස්තකාලයාධිපති - සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.
girakaduwa@gmail.com

අලෙවිකරණය යන සංකල්පය මූල්‍යමය අරමුණු සපුරා ගැනීම උදෙසා මිලදීගැනීම හා විකිණීම පමණක් සිදු කෙරෙන ලාභ අරමුණුකරගත් ආයතනයන්ට පමණක් සීමා වූවක් නොවන අතර ලාභාපේක්ෂාවෙන් ක්‍රියා නොකරන පුස්තකාල වැනි සමාජ සේවා ආයතන උදෙසා ද ස්වකීය ආයතනයේ අරමුණු හා පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා පොදු වූවකි. පුස්තකාලයක සේවා අලෙවිකරණය තුළ තොරතුරු නිෂ්පාදන ක්‍රියාවලිය උපයෝජකයන් කේන්ද්‍ර කරගනිමින් විධිමත් බෙදා හැරීම හා පාලනය කිරීම සිදුකළ හැකි ය. එමඟින් පුස්කාලයේ ප්‍රගමනය හා සේවා ප්‍රවර්ධනය වීම ද සිදු වේ. ශ්‍රී ලංකාවේ තොරතුරු සේවා පද්ධතියේ ප්‍රධාන භූමිකාවක් ඉටුකරන පුස්තකාල පද්ධතිය තුළ අලෙවිකරණ ක්‍රියාවලිය ශක්තිමත් නොවීම සහ ස්වකීය පාඨක ප්‍රජාව තෘප්තිමත් වන අයුරින් ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත්වී ඇති බවක් දක්නට ලැබේ. මෙකී තත්ත්වය පාදක කරගනිමින් විශේෂ පුස්තකාල තුළ තොරතුරු අලෙවිකරණය සම්බන්ධයෙන් දක්නට ඇති ප්‍රගමනය හා ඒ හමුවේ උපයුක්ත ගැටලු සොයා බැලීමත් මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන ගැටලුව විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රගත විශේෂ පුස්තකාල දහයක් නියැදිය වශයෙන් යොදා ගනිමින් ඒ ආශ්‍රිත තොරතුරු සේවා අලෙවිකරණය සම්බන්ධයෙන් පවත්නා වූ අද්‍යතන තත්ත්වයන් පිළිබඳව නිසි අවබෝධයක් ලබා ගැනීමත්, තොරතුරු අලෙවිකරණ ක්‍රියාවලිය තුළ ඉලක්කගත සේවාවන් සැළසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම මෙන් ම තොරතුරු අලෙවිකරණය විශේෂ පුස්තකාල සඳහා යොදාගනු ලබන ආකාරය හා අලෙවිකරණ ක්‍රියාවලියේදී පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන මුහුණ දෙන්නා වූ බහුවිධ ගැටලු හඳුනාගැනීම මෙම අධ්‍යයනයෙහි මුඛ්‍ය අරමුණ විය. මෙහිදී සමීක්ෂණය මඟින් දත්ත රැස්කර ගන්නා ලද අතර ද්විතීයික වශයෙන් දේශීය හා විදේශීය වශයෙන් ඇති මූලාශ්‍ර ගවේෂණය කිරීම සිදු කරන ලදි. මෙසේ රැස් කර ගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදි. එකී තොරතුරුවලට අනුව තොරතුරු අලෙවිකරණය පුස්තකාල තුළ තෘප්තිමත් ආකාරයෙන් ක්‍රියාත්මක නොවන බව ගම්‍ය විය. ඒ අනුව තොරතුරු සැපයීම පිළිබඳ මනා අවබෝධයක් නොමැතිවීමත්, පුස්තකාල ක්ෂේත්‍රය තුළ පවත්නා විභවාවස්ථාවන් පුස්තකාලයාධිපතීන් නිවැරදිව හඳුනා නොගැනීම හා ඊට ඔවුන් සූදානම් නොවීමත්, වෙළඳපොළ තුළ තොරතුරු අලෙවිය සඳහා ඇති ඉල්ලුම හා ඒ සඳහා ඇති තරඟකාරිත්වයන් ජයග්‍රහණය කර ගැනීමට පුස්තකාලයාධිපතීන් සූදානම් නොවීමත් අලෙවිකරණ ක්‍රියාවලිය පුස්තකාලයන් තුළ ක්‍රියාත්මක කිරීමේදී මතුව ඇති දුර්වලතාවයන් ලෙස මෙම අධ්‍යයනයේ දී අනාවරණය කරගත හැකි විය. මීට හේතූන් ලෙස පුස්තකාල සම්පත්වල ඇති සීමා සහිත බව, ප්‍රචාරණ දුර්වලතා, තාක්ෂණික හා භාෂාමය බාධක මෙන්ම නිසි ප්‍රතිපත්ති රාමුවක් රහිත වීමද ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. ඒ අනුව තොරතුරු අලෙවිකරණය සම්බන්ධයෙන් පුස්තකාලයාධිපතිවරුන්ගේ දැනුම පෝෂණය කිරීම, විශේෂ පුස්තකාල අතර අන්තර් සහයෝගිතා වැඩි දියුණු කිරීම, ස්වකීය සේවාවන් පුළුල් කිරීම හා උපයෝජකයන් අතර මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රචාරණයක් ලබා දීම ආදිය තුළින් පුස්තකාලය තුළ සක්‍රිය තොරතුරු අලෙවිකරණයක් ක්‍රියාත්මක කළ හැකි බව පෙනේ.

*මූලපද : අලෙවිකරණය, තොරතුරු අලෙවිකරණය, තොරතුරු සේවා, පුස්තකාල සේවා, විශේෂ පුස්තකාල*